Spreadora Licence

> **මේ පිටුව මේ guide එකේ activation කොටස වෙනුවට.** Spreadora 1.1 එකේ activation මේ විදිහට වෙනස් වුණා.
> This page replaces the activation section in this guide.

Activate කරන විදිහ

1. Spreadora open කරලා ඔයාට ලැබුණු **Licence key** එක දාන්න (SPR-XXXX-XXXX-XXXX).
2. **Activate** ඔබන්න. Internet ඕන.

Devices 2යි

- එක licence එකක් එකවර devices 2කට විතරයි.
- 3වෙනි computer එකක activate කළොත්, දැනට තියෙන devices 2 පෙන්නනවා. එකක් තෝරලා **Sign out** කරන්න පුළුවන්.
- Internet නැතුව දවස් 7ක් වැඩ කරනවා.
- Computer එක මාරු කරනවා නම් menu එකේ **Sign Out of This Mac / PC** ඔබන්න.

Free trial

Licence එකක් නැතුව දවස් 30ක free trial එකක් ගන්න පුළුවන්. Computer එකකට එක පාරයි.

In English

Open Spreadora, enter your licence key and press Activate. One licence works on 2 devices at a time. On a third device, you choose which one to sign out. It works offline for 7 days. Moving computers? Use Sign Out of This Mac / PC in the menu.

Spreadora

BY VELQORA LABS

සම්පූර්ණ මාර්ගෝපදේශය

Version 1.0 · Mac සහ Windows

Spreadora කියන්නේ photographers ලට wedding සහ event albums ඉක්මනින් design කරන්න හදපු software එකක්. Photos import කරලා album එක ඉඛේම හදාගන්න, අතින් සකස් කරන්න, client ට link එකකින් යවන්න, print files export කරන්න පුළුවන්.

> **ඉක්මනින් පටන් ගන්න:** Install කරන්න → **Free Trial** → **New project** → **Import photos** → **Auto design** → **Client Proof** → **Export**. මේ guide එකේ හැම පියවරක්ම විස්තරයි.

අන්තර්ගතය

1. Install කිරීම · 2. Free Trial සහ License · 3. පළමු album එක · 4. Screen එක · 5. Spreads · 6. Photos edit කිරීම · 7. Layouts සහ Templates · 8. Layers, Grid, Guides · 9. Titles සහ Quotes · 10. Logo · 11. Cover · 12. Photo Check · 13. Client Proof · 14. Export · 15. Save කිරීම · 16. Shortcuts · 17. ගැටළු · 18. Uninstall

1 Install කිරීම

Mac	**Spreadora.pkg** · macOS 11 හෝ අලුත්. MP4 video සඳහා macOS එක update කරලා තියෙන්න ඕන.
Windows	**Spreadora-Setup.exe** · Windows 64-bit
Internet	Activation එකට සහ client links වලට ඕන. Album design කරන්න හැම වෙලාවෙම ඕන නෑ.


Mac

1. **Spreadora.pkg** double-click කරන්න.
2. "Apple could not verify" වගේ message එකක් ආවොත් **Done** click කරලා **System Settings** → **Privacy & Security** එකට යන්න. පහළට ගිහින් **Open Anyway** click කරලා Mac password එක දාන්න.
3. **Continue** → **Install** ඔබලා ඉවර කරන්න.
4. **Applications** එකෙන් **Spreadora** open කරන්න. Open නොවුණොත් ආයේ **Open Anyway** කරන්න.

Windows

1. **Spreadora-Setup.exe** double-click කරන්න.
2. "Windows protected your PC" ආවොත් **More info** click කරලා **Run anyway** click කරන්න.
3. Install location එක තෝරලා **Install** click කරන්න.
4. Desktop එකෙන් හෝ Start menu එකෙන් **Spreadora** open කරන්න.

2 Free Trial සහ License දවස් 30ක් නොමිලේ



පළමු පාර open කළාම

දවස් 30 free trial එක

1. Spreadora පළමු පාර open කළාම ඔයාගේ email එක type කරන්න.
2. **Start 30-Day Free Trial** click කරන්න.
3. ඒ දවස් 30ම හැම feature එකක්ම පාවිච්චි කරන්න පුළුවන්. Toolbar එකේ ඉතුරු දවස් ගණන පේනවා: **Trial: 30 days left**.


> එක computer එකකට trial එක එක පාරයි. Uninstall කරලා ආයේ install කළාට trial එක ආයේ පටන් ගන්නේ නෑ. Trial එකට internet ඕන නෑ, client link එකට විතරක් ඕන.

License එක ගන්න

1. License එකක් ගන්න **hello.velqoralabs@gmail.com** එකට කතා කරන්න. Key එක (SD-XXXX-XXXX-XXXX-XXXX) email හෝ WhatsApp එකෙන් එවනවා.
2. App එකේ toolbar එකේ **Trial: … · Activate** click කරන්න (හෝ Home → **Account** → **Activate License**).
3. Key එක දාලා **Activate** click කරන්න. Internet ඕන. ඔයාගේ projects එහෙමම තියෙනවා.
4. Trial එක ඉවර වුණාම app එක open කරද්දීම key එක ඉල්ලනවා.

> එක key එකක් computers 2කට. Activate කළාට පස්සේ internet නැතුව දවස් 3ක් වැඩ කරනවා. Key එක කාටවත් දෙන්න එපා. Mac සහ Windows දෙකටම එකම key එක.

3 පළමු album එක විනාඩි කීපයකින්




Home screen: **+ New project** මෙතන. පරණ projects දකුණු පැත්තේ.

1. **+ New project** click කරලා නමක් දීලා **Start** ඔබන්න.
2. **Import photos** click කරලා photos තෝරන්න.
3. Spreads කීයක් ඕනද කියලා අහනවා. අංකයක් දාන්න.
4. ✨ **Auto design** click කරන්න. හැම spread එකක්ම වෙනස් විදිහට design වෙනවා. කැමති නැත්නම් ආයේ click කරන්න, අලුත් design එකක් එනවා.
5. Spread එකක් වෙනස් කරන්න **Edit this spread** (හෝ **Enter**) ඔබන්න. ඉවර වුණාම ආයේ **Enter**.


> වැඩ ඉබේම save වෙනවා. **Undo** සහ **Redo** ඕන වෙලාවක පාවිච්චි කරන්න පුළුවන්.

4 Screen එක




Spreads වම් පැත්තේ, album එක මැද, photos පහළ, settings දකුණු පැත්තේ.


Import photos	Photos ගේන්න
Auto design	ඔක්කොම spreads ඉඛේම design කරන්න
Edit this spread	පේන spread එක edit කරන්න (Enter)
Client Proof	Client ට album එක යවන්න
Album ▾	Album size, style, layout, background
Export ▾	JPG, PDF, PSD, Print, DPI
⋯ More	Cover, Photo Check, Import folders, Open / Save project, Tips, About, භාෂාව



Album ▾



Export ▾



⋯ More

> මැද උඩ තියෙන **Toolbar, Spreads, Photos, Panel, Focus** buttons වලින් කොටස් හංගලා වැඩ කරන්න ඉඩ ගන්න පුළුවන්. **Focus** (F key) එකෙන් spread එක විතරක් පේනවා.

5 Spreads

- Spread එකක් click කළාම ඒක open වෙනවා.
- ඇදගෙන ගිහින් හෝ ▲ ▼ වලින් පිළිවෙළ මාරු කරන්න.
- ⧉ Spread එක duplicate කරනවා. × Spread එක මකනවා, photos අයින් වෙලා **Not in album** එකට යනවා.
- ＋ හිස් spread එකක් එකතු කරනවා.
- **Spread tools** ඇතුළේ first page සහ last page single pages විදිහට හදන්න පුළුවන්.
- පහළ **Not in album** එකේ තියෙන photos spread එකකට ඇදලා දාන්න.

6 Photos edit කිරීම Edit mode එකේ, photo එකක් තෝරලා



Photo එක ගෙනියද්දී නිල් ඉරි = photo එකේ centre, සුදු ඉරි = page එකේ centre, රෝස ඉර = ඇලුණු තැන.

ගෙනියන්න	Photo එක ඇදගෙන යන්න
ප්‍රමාණය	Corner එකෙන් ඇදන්න. **Shift** = දැන් හැඩය තියාගන්න, **Cmd/Ctrl** = photo එකේ original හැඩය
Photo එක ඇතුළේ ගෙනියන්න	**Alt** + drag
Photos කීපයක්	**Shift**-click කරලා තෝරලා එකට ගෙනියන්න හෝ resize කරන්න
🧲 **Magnet**	Photos සහ text, margin සහ centre වලට ඇලෙනවා. ඕන තැනක තියන්න ඕන නම් Magnet tick එක අයින් කරන්න. Tick එක spread එකට උඩ දකුණේ.





Photo tab

Arrange	Align, Distribute (photos 3ක් හෝ වැඩි), Duplicate, Lock, Group, Rotation
Border	Border ඝනකම, පාට, opacity
Shadow	Shadow on, opacity, blur, distance, direction, පාට
Frame & zoom	Zoom, Whole spread, Full page, Reset
Light & colour	Lightroom වගේ exposure, contrast, temperature ආදිය
Photo Check	මේ photo එකේ focus, exposure ලකුණු

7 Layouts සහ Templates




Layout samples open කරලා Left page, Right page හෝ Whole spread තෝරලා layout එකක් click කරන්න.

- **Page** tab → **Browse all layouts**: page එකට ගැළපෙන layouts ඔක්කොම.

- **Page** tab → ▦ **Templates**: photos ගණන (1 සිට 8) සහ Vertical, Horizontal, Full Bleed, White Space, Gutter Safe, Hero වලින් filter කරන්න.
- **Save this page** හෝ **Save this spread**: ඔයාගේම layout එක template එකක් කරන්න. මේවා ඒ computer එකේ save වෙනවා.
- **Auto design uses my templates** tick කළාම Auto design එකට ඔයාගේ templates ගන්නවා.
- **Album** ▾ → **Style**: Modern, Luxury, Minimal, Cinematic ආදිය margin සහ gap වෙනස් කරනවා.

8 Layers, Grid, Guides




- **Layers** tab එකේ text සහ photos ලැයිස්තුව.
- Row එක උඩට mouse එක ගෙනිච්චාම lock සහ ඇහැ (hide) icons පේනවා. හැංගුවොත් export එකටත් එන්නේ නෑ.
- Row එක click කළාම නම වෙනස් කිරීම (✎) සහ ඉදිරියට/පිටුපසට buttons එනවා.
- Text හැම වෙලාවෙම photos වලට උඩින් තියෙන්නේ.

Grid සහ Guides


- **Page** tab → **Grid & guides**.
- **Show grid**: grid එකයි safe area ඉරයි පෙන්නනවා.
- ＋ **Vertical / Horizontal**: Guide එකක් දාන්න, ඇදගෙන ගිහින් තියන්න. Spread එකෙන් පිටට ඇද්දම අයින් වෙනවා.
- මේවා export වෙන්නේ නෑ.

9 Titles සහ Quotes අතින් type කරන්න ඕන නෑ



Titles tab: නම් දැම්මාම designs වලට ඉබේම එනවා. යෝජනාවක් click කළාම spread එකට එනවා.

1. **Titles** tab එකේ **Bride, Groom, Date** දාන්න.
2. Category එකක් තෝරන්න: **Wedding, Homecoming, Engagement, Birthday, Family, Anniversary**.
3. **Titles, Short quotes, Long quotes, Minimal** අතරින් තෝරන්න.
4. List එක scroll කරලා කැමති එක click කරන්න.
5. Text එක click කරලා වචන, font, size, පාට, Gold, spacing, rotation, shadow, stroke වෙනස් කරන්න.




🎨 **Designs**: Search කරන්න (love, home, birthday), category, වර්ගය, style වලින් filter කරන්න.

- Design එකක හැම line එකක්ම වෙනම click කරලා edit කරන්න පුළුවන්. ඇදගෙන ගියාම lines ඔක්කොම එකට යනවා. වෙන් කරන්න **Ungroup**.
- **Same style on all lines**: එක line එකේ font, පාට අනිත් lines වලටත් දානවා.
- **Save as Custom Template**: ඔයා හදපු එක save කරන්න. **Designs → Custom Templates** එකේ නම වෙනස් කරන්න, මකන්න පුළුවන්.
- ✨ **Suggest**: Spread එකට ගැළපෙන designs 5ක් පෙන්නනවා. මේක තෝරන්නේ album එකේ තැන, folder නම් සහ photos අඳුරුදැ කියන එකෙන්.
- **Fonts**: Font නම click කරලා Search කරන්න, Serif, Script, Sinhala වගේ tabs, ★ favourites.

10 Logo

- **Logo** tab එකෙන් studio logo එක දාන්න. හැම spread එකකම හෝ තෝරපු ඒවායේ පේනවා, export එකටත් එනවා.
- Size, opacity, margin වෙනස් කරන්න පුළුවන්.


11 Cover ··· More → Cover



Back cover, spine, front cover එක sheet එකක. රෝස ඉර = කපන තැන, නිල් ඉරි = spine.

- වර්ග 8ක්: Photo, Full bleed, Wrap, Minimal, Leather, Text only, Couple portrait, Collage.
- Material, Front/Back photo, Title, Date, Spine text, Back text, font, Gold.
- **Spine** සහ **Bleed** මිනුම් ඔයාගේ print lab එකෙන් අහලා දාන්න. Album වර්ගය අනුව වෙනස්.
- JPG, PDF, layered PSD වලට export කරන්න. ඉරි export වෙන්නේ නෑ. Crop marks ඕන නම් tick කරන්න.


12 Photo Check ··· More → Photo Check



Import කළාම photos පිටුපස ඉබේම පරීක්ෂා වෙනවා.

- Focus අඩු, අඳුරු, එළිය වැඩි photos හොයනවා.
- සමාන photos group කරලා **Keep best** එකෙන් හොඳම එක තියාගන්න පුළුවන්.
- Print වලට resolution මදි photos වල රතු තිතක් පේනවා. Export කරද්දීත් මතක් කරනවා.
- මේක ගණනය කිරීමක්. මුහුණු, ඇස් වැහිලාද කියන එක නාම හඳුනාගන්නේ නෑ. අන්තිම තීරණය ඔයාගේ.

13 Client Proof Client ට album එක යවන්න · log වෙන්න ඕන නෑ




Client Proof

Link එකෙන් යවන්න (ලේසිම ක්‍රමය)

1. Client Proof click කරන්න.
2. **Your WhatsApp, for replies** එකට ඔයාගේ අංකය දාන්න. මේක එක පාරක් දැම්මාම මතක තියාගන්නවා. මේක නැත්නම් client ට WhatsApp button එක පේන්නේ නෑ.
3. **Client WhatsApp** එකට client ගේ අංකය දාන්න (කැමති නම්).
4. **Details** ඇතුළේ Studio name, Couple, Album title, Date බලන්න.
5. 🔗 **Share on WhatsApp** ඔබන්න. Album එක upload වෙලා, link එක message එකට එනවා, WhatsApp open වෙනවා. **Send** ඔබන්න.

> **Account එකක් හෝ log වීමක් ඕන නෑ.** Internet තියෙන්න ඕන. Album එකේ ප්‍රමාණය අනුව විනාඩි කීපයක් යන්න පුළුවන්. Link එක වීතරක් ඕන නම් **Create link** → **Copy share link**.

Client දකින දේ



පළමු page එක, නම්, Open album




පිටු පෙරළන්න: ‹ › , swipe, ඊතල keys. Favourite, Comment, Zoom.

- Client ට phone එකෙන් හෝ computer එකෙන් browser එකේ බලන්න පුළුවන්. App එකක් ඕන නෑ.
- Link page එකේ උඩ Google notice එකක් පේනවා. ✕ ඔබලා වහන්න පුළුවන්.

- WhatsApp message එකේ link එකට album picture එකක් පේන්නේ නෑ, link එක text එකක් විදිහට යනවා.

Client ගේ reply එක




Client **Finish** ඔබලා Approve හෝ Request changes තෝරලා reply එක එවනවා.

1. Client ට message එකක් එනවා: Approve/Changes, favourites, comments.
2. ඒ message එක මුළුමනින්ම copy කරන්න.
3. **Client Proof → Client's reply** කොටුවේ paste කරලා **Read reply** ඔබන්න.
4. Comments spread අනුව පේනවා. Spread අංකය click කළාම ඒ spread එකට යනවා. ඉවර වුණු ඒවා tick කරන්න.
5. වෙනස්කම් කරලා අලුත් link එකක් යවන්න. Version එක v2, v3 වෙනවා.

Status

Draft → Sent to client → Client reviewing → Revision requested → Revised → Approved → Print ready. යැවිවාම සහ reply එක කියෙව්වාම ඉඛේම මාරු වෙනවා. Click කරලා ඔයාටත් මාරු කරන්න පුළුවන්. **Proofs sent** එකේ යැවූ versions සහ වෙලාව පේනවා.

File එකක් විදිහට



Or save a file සහ MP4 settings

📖 **Flipbook**	Internet නැතුව browser එකේ open වෙන තනි file එකක්. සමහර phones වල WhatsApp preview එකේ වැඩ නොකරන්න පුළුවන්, Chrome/Safari එකෙන් open කරන්න කියන්න.
PDF	Title page එකක් එක්ක, watermark සහිතව.
JPG	Spread එකකට file එක බැගින්.
🎬 **MP4**	Album එක video එකක්. **Page turn**, Fade, Slide. Spread එකකට තත්පර 2-8. WhatsApp 720p හෝ 1080p. Phone එකේ කෙලින්ම play වෙනවා.
Music	**Background music → Choose a song**. ඔයාට අයිතිය තියෙන music විතරක් පාවිච්චි කරන්න.

Watermark: Details එකේ text, opacity වෙනස් කරන්න පුළුවන්. **Quality:** Standard 1600 px, High 2600 px. Print files වලට watermark එන්නේ නෑ.

Privacy: Link එකක් හැදුවාම watermark සහිත low-resolution album එක online storage එකකට යනවා. Link එක තියෙන ඕන කෙනෙක්ට බලන්න පුළුවන්, ඒ නිසා client ට විතරක් යවන්න. Links දවස් 120කින් මැකෙනවා.

14 Export Print files

- **Export** ▾ → **Per spread** හෝ **Per page** තෝරන්න.
- DPI: 150, 200, **300 (print)**, 400.
- **JPG**, **PDF (full)**, **PDF (WhatsApp small)**, **PSD (layers)** හෝ **Print** click කරන්න.
- All spreads, මේ spread එක, හෝ range එකක් තෝරන්න.
- Folder එකක් තෝරන්න. ඉවර වුණාම folder එක ඉබේම open වෙනවා.
- Export කරන්න කලින් Photo Check එකේ ගැටළු තියෙනවා නම් මතක් කරනවා.

15 Project save කිරීම

- වැඩ ඉඛේම save වෙනවා. ⌂ **Home** එකෙන් recent projects open කරන්න.
- වෙනත් computer එකකට ගෙනියන්න හෝ backup එකකට ⋯ **More** → **Save project**. File එක **Open project** එකෙන් open කරන්න.
- Project file එකේ photos ඇතුළත් නිසා file එක ලොකු වෙන්න පුළුවන්.
- භාෂාව: ⋯ **More** → **Language** (English / සිංහල).

16 Keyboard shortcuts

Enter	Edit mode / Save & close
Cmd/Ctrl + Z	Undo
Cmd/Ctrl + Shift + Z	Redo
F	Focus: spread එක විතරක්
◀ ▶	Spread මාරු කරන්න (photo එකක් තෝරලා නැති විට)
ඊතල keys	Edit mode එකේ තෝරපු photo/text චුට්ටක් ගෙනියන්න. Shift = වැඩියෙන්
Delete	තෝරපු photo එක Not in album එකට
Cmd/Ctrl + D	Duplicate
Cmd/Ctrl + C, X, V	Photos copy, cut, paste
Esc	Dialog එකක් වහන්න

17 ගැටළු ආවොත්

"Apple could not verify" / "Windows protected your PC"	1 වන කොටසේ පියවර කරන්න. Software එක Apple/Microsoft එකෙන් signed නැති නිසා මේක එනවා.
Trial එක ඉවරයි කියනවා	License key එකක් ගන්න අපට කතා කරන්න. Projects මැකෙන්නේ නෑ.
Key එක වැරදියි කියනවා	මුළු key එකම copy කරලා බලන්න. හිස්තැන් තියෙනවාද බලන්න.
Date එක වැරදියි කියනවා	Computer එකේ දිනය හරියට දාලා ආයේ open කරන්න.
"already used on 2 PCs"	Key එක computers 2කට. අපට කියන්න.
Link එක හැදෙන්නේ නෑ	Internet එක බලලා ආයේ try කරන්න. දිගටම නම් අපට කියන්න. ඒ අතරේ PDF/MP4 file එක යවන්න පුළුවන්.
Client ට WhatsApp reply button එක නෑ	**Your WhatsApp, for replies** දාලා අලුත් link එකක් හදන්න.
"This album link has ended"	දවස් 120ක් පහු වෙලා. අලුත් link එකක් හදන්න.
MP4 හදන්න බෑ කියනවා	System එක update කරන්න, නැත්නම් Flipbook/PDF යවන්න.
Music නැතුව video එක ආවා	වෙනත් mp3/m4a එකක් try කරන්න.
Photo එක ගෙනියන්න බෑ	Edit mode එකේද බලන්න (Enter). Photo එක Lock වෙලාද බලන්න.

Photo එක ඕන තැනට යන්නේ නෑ, ඇලෙනවා	🧲 Magnet tick එක අයින් කරන්න.

18 Uninstall

Mac	**Uninstall Spreadora** open කරලා copies තෝරන්න. ඒවා Trash එකට යනවා.
Windows	**Uninstall Spreadora.exe** open කරලා Yes click කරන්න, නැත්නම් Settings → Apps → Spreadora → Uninstall.
ඔයාගේ වැඩ	Photos සහ save කරපු project files මැකෙන්නේ නෑ.